# හොඳ සිංහල 4



**වි. ක. ධර්මබන්ධු**

## සිංහල ඉගෙන ගන්නට කැමති සැමට සන්නස සේවාවකි මේ

කැකිල්ලෙ රජ්ජුරුවොයි ඔය එන්නේ හිටපල්ලා(හ්) නිස්සද්ද වෙලා
පැමිණිලිකරුවොයි වැරදි කාරයෝ විත්තිකාරයෝ නිදහස්

යන ගී කඩ ඔබ දනිති. මෙහි වැකි තුනක් ඇත.

1 ඔය එන්නේ කැකිල්ලේ රජ්ජුරුවෝ ය.
2 වැරදිකාරයෝ පැමිණිලිකාරුවෝ ය.
3 විත්තිකාරයෝ නිදහස් ය.

ඔය එන්නේ කැකිල්ලේ රජ්ජුරුවෝය යන වැකියය විරිත රැකීම සඳහා දෝ රජ්ජුරුවොයි යනුවෙන් වෙනස් කර ඇත. එය අනුක්ත රූප පාඩමේදී උගනිමු. 2 හා 3 වැකි ඉතා හොඳින් ගැලපී ඇති නිවැරදි වැකි වේ. එම වැකි දෙකේ ආඛ්‍යාතය වන වෙති යන බහු වචන ආඛ්‍යාත පදය වෙනුවට ය නිපාතය යෙදී ඇති සැටි තේරුම් ගන්න.

චිවිත්ව උක්ත සහිත වාක්‍ය වල ආඛ්‍යාතය වෙනුවට ය යි නිපාත යෙදිය හැකි ය.

බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ය/යි.
෴මයෝරිහු නවසීලන්තයේ ඇවසියෝ ය/යි.
෴මේ ආයතනයේ පාලකයෝ අපි ය/යි.
෴මේ පාසලේ මුල් ගුරුවරයා මම ය/යි.
අංගුලිමාලයා මිනී මරුවෙක් ය.

මෙහි ෴ යොදා ඇති වාක්‍ය වල උක්ත දෙක මාරුකොට වුව ද ලිවිය හැකි ය. එවිට ඒ වැකි,

නවසීලන්තයේ ඇවැසියෝ මයෝරිහු ය/යි.
අපි මේ ආයතනයේ පාලකයෝ ය/යි.
මේ පාසලේ මුල් ගුරුවරයා මම ය/යි.

වේ.

එම වැකි වලට (ශ්‍රැති ශ්‍රවන) ඇසූ දේ කීම සඳහා ආඛ්‍යාත රහිතව ල/ලු නිපාත යෙදිය හැකි ය.

බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ල/ලු.
මයෝරිහු නවසීලන්තයේ ඇවසියෝ ල/ලු.
මේ ආයතනයේ පාලකයෝ අපි ල/ලු.
මේ පාසලේ මුල් ගුරුවරයා මම ල/ලු.
අංගුලිමාලයා මිනී මරුවෙක් ල/ලු.

එම වැකි ම ද නිපාතය යොදා ප්‍රශ්න බවට පත් කළ හැකි ය.

බොහෝ සිංහලයෝ බෞද්ධයෝ ද?
මයෝරිහු නවසීලන්තයේ ඇවසියෝ ද?
මේ ආයතනයේ පාලකයෝ අපි ද?
මේ පාසලේ මුල් ගුරුවරයා මම ද?
අංගුලිමාලයා මිනී මරුවෙක් ද?

උක්ත රූපය යෙදෙන නාම දාතුක ක්‍රියා සහිත වාක්‍යවල ද යෙදේ.

මම ගුරුවරයෙක්මි.
මම ගායකයෙක්මි.
හේ/ඔහු පිස්සෙකි.
ඕ/ඈ නිළියකි.
මෝ/මෑ ගායිකාවකි.
තෝ/ඔබ (තුමා) ලේඛකයෙක් හි/ ලේඛකයෙකි.

ආඛ්‍යාතය වෙනුවට ඇත/ඇති - නැත/නැති යන පද යෙදෙන වැකි වල (උක්ත) කර්තෘ පදය වශයෙන් යෙදේ.

හැම ගමකම නායකයෙක් ඇත/ඇති.
මේ රටේ කොටි නැත/නැති.
මේ ගඟේ කිඹුල්ලු නැත/ නැති.
තාත්තා අද ගෙදර නැත/ නැති.
අපේ නිලධාරි මණ්ඩලයේ කාන්තාවක් ද ඇත /ඇති.

ද, හා , සහ යන සමුච්චායාර්ථ නිපාතයක් හෝ ත් සමඟ යෙදෙන කර්තෘ පද වශයෙන් යෙදේ.

පියා ද මවද / පියා ද දරුවෝ ද නිවසේ වෙසෙති.
මුත්තා හා මිත්ත (හා)/ මුත්තෝ හා මිත්තෝ (හා) බණ අසති.
පියෙක් සහ මවක්/ ගුරුවරු සහ සිසුහු විදුහල්පති හමුවෙති.
අක්කාත් මමත් දුම්රියට නැගුනෙමු.
තාත්තාත් නුඹත්/ තාත්තලාත් නුඹලාත් බොරු කීහු/කීහ.

ද නිපාතය මෙන්ම හා නිපාතය ද දෙපලේ ම යෙදීම පැරණි රීතියයි. දැන් එය එක් පළක පමණක් යෙදේ. අපිත් එය පිළිගනිමු. සහ නිපාතය එදා යෙදුණේ සමඟ යන අරුතිනි.
සුරත් සහ සහසැස්
නොකැරැ සිටියේ අහස් කුස් හිස්
යන ගීය සුරෝ සහ සහසැස් නොකැරැ සිටියෝ අහස් කුස් හිස් යන ලෙසට නොලියවුණේ එහෙයිනි. එහෙත් අද එය ඉංගිරිසියේ and යන පදය වෙනුවට යෙදේ. අපි එය ද පිළිගනිමු.

වාක්‍යයක බහු වචන උක්තය වශයෙන් යෙදෙන දෙන, දෙනෙක් යන පදයක මුලට යෙදේ.

අපි හැම දෙන ම නයා දුටුවෙමු.
ඔහු තිදෙන හින්දි භාෂාව අගනිති.
අපි දෙදෙනා මිතුරෝ වෙමු.
නියෝජිතයෝ හැම දෙනා ම මගේ අදහස පිළිගත් හ.
අනතුරින් ස දෙනෙක් මළ හ.
නිවසේ කී දෙනෙක් සිටිද් ද? දෙදෙනෙක් සිටිති.

ප්‍රාර්ථනාර්ථ වා නිපාතය සහිත වාක්‍යයක උක්තය වශයෙන් යෙදේ.

ඔබ  සුවපත් වේ වා/ වෙත් වා.
කාන්තාවෝ පෙරමුණ ගනිත් වා / පෙරමුණට එත් වා.
සියලු සත්වයෝ නිදුත් වෙත්වා සුවපත් වෙත්වා.
ඔහු/ ඔවුහු සත්‍යය දකිත්වා.
ශ්‍රී ලංකාවට බුද්ධිමත් නායකයෙක් පහළ වේ වා.
අපි මේ විපතින් මිදෙමු වා/ මිදෙම් වා./ මිදෙන්නමෝ වා/ මිදෙමෝ වා.

මිදෙම් සහ මිදෙමු යන දෙපදයේ ම ස්වරය ලොප් කළ විට මිදෙම් වේ. එහෙයින් මම අපි දෙකටම එය යෙදිය හැකි ය.

ඉතිරිය ලබන කලබේ.

## කැමට පසු.....

අසද්කදකොරොස් ලියයි




ලුහුඬු දැන්වීම්

First 25 words - $20.00 .
Each additional word $1.00

පළමු වචන 25 සඳහා ඩොලර් 20.00
අතිරේක වචනයක් ඩොලර් 1.00

**Sannasa**
PO Box 172 Reservior
VIC 3073   Australia
email: info@sannasa.net

**AUTO CARE**

**Kandy Lube**
**All Mechanical Repairs**
**03 9462 2199**

**Visiting Tutor**
Are you looking for a tutor in mathematics and accounting for your child. Look no further, I am much experienced and qualified in accounts and finance. I am an excellence academic scholarship winner from La Trobe University.
**For students from year 4 to VCE and 1st year Uni.**
Contact me
**Sanjeewa Pothupitiyage**
Mobile 0422 138 892
Tel : 03 9460 2408

**Sannasa Advertising**

**සන්නස**
**වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

**Denzil Jayaweera**
Mobile: 0425 851 991
0401 714 408

**Saliya Galappaththie**
Mobile : 0422 671 826
TP 03 9310 4196

**Asoka Subasinghe**
Mobile 0425 720 932
TP 03 9796 4241